# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 දෙසැම්බර්

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) -2.0%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -1.7ක් ලෙස වාර්තා විය. 2024 දෙසැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -0.4%ක හා ආහාර නොවන කාණ්ඩයේ -1.6%ක දායකත්වයක් පිළිවෙළින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 නොවැම්බර් මාසයේදී 0.0% සිට 2024 දෙසැම්බර් මාසයේ -1.0% දක්වා අඩු වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 නොවැම්බර් මාසයේදී -3.1% සිට 2024 දෙසැම්බර් මාසයේදී -2.9% දක්වා වැඩි වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම:2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2024 නොවැම්බර් මාසයේ 202.4 ක් වූ දර්ශකාංකය, 2024 දෙසැම්බර් මාසයේ දී 204.6 ක් දක්වා වැඩි වී ඇති බව වාර්තා විය. මෙය 2024 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2024 දෙසැම්බර් මාසයේ දර්ශකාංකය 2.2ක වැඩිවීමක් එනම් 1.09ක ප්‍රතිශතාංක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 1.14% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.05% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූ විට මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, පොල්, සහල්, අමු මිරිස්, අලුත් මාළු, පොල් තෙල්, කුකුළු මස්, අර්තාපල්, බී ළූණු, අලුත් පලතුරු, රතු ළූණු, කහ කුඩු සහ සියඹලා යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත් දෙහි, බිත්තර සහ සෝයා මීට් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩු වීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'මද්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය' (පුවක්) සහ 'ප්‍රවාහන'(පෙට්‍රල් හා ඩීසල්), 'විනෝදාත්මක සහ සංස්කෘතික', 'රෙදිපිළි සහ පාවහන්' (පාවහන්) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩු වීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', සහ 'විවිධ භාණ්ඩ සහ සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. තවදුරටත් සලකා බැලීමේදී, 'සෞඛ්‍ය', 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල දෙසැම්බර් මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 නොවැම්බර් මාසයේ 1.5% සිට 2024 දෙසැම්බර් මාසයේදී 1.3% දක්වා අඩු වීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2023 | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| 2024 | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |
| | ජූලි | 206.9 | 234.0 | 189.4 | 193.7 | -0.6 | 0.0 | 2.5 | 2.9 | 2.2 | 3.0 |
| | අගෝ. | 204.1 | 229.7 | 187.6 | 193.0 | -1.4 | -0.4 | 1.1 | 2.3 | 0.2 | 2.3 |
| | සැප්. | 203.1 | 227.9 | 187.1 | 192.5 | -0.5 | -0.3 | -0.2 | 0.5 | -0.7 | 1.9 |
| | ඔක්. | 202.1 | 227.1 | 186.0 | 192.4 | -0.5 | -0.1 | -0.7 | 1.3 | -2.3 | 1.7 |
| | නොවැ. | 202.4 | 228.0 | 185.9 | 192.2 | 0.1 | -0.1 | -1.7 | 0.0 | -3.1 | 1.5 |
| | දෙසැ. | 204.6 | 233.9 | 185.7 | 192.1 | 1.1 | -0.1 | -2.0 | -1.0 | -2.9 | 1.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව